
# තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය

## 10. විද්‍යා වර්ගීකරණය

පැවරුම්



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## පැවරුම්

1. එක්තරා ඥාන සම්ප්‍රදායන් දෙකක් එකිනෙකින් වියුක්තව පවතින තාක් විද්‍යාව නොවන බව ප්‍රැන්සිස් බේකන් පැවසීය. එම ඥාන සම්ප්‍රදායන් දෙක වනුයේ,

    i. අනුභූතික හා බුද්ධිමය
    ii. ගතානුගතික හා පාරභෞතික
    iii. ශාස්ත්‍රීය හා ශිල්පීය
    iv. ප්‍රාග් අනුභූත හා ආනුභූතික
    v. මනෝමූල හා වාස්තවික

2. කාර්ල් පොපර් ට අනුව අසත්‍යය වූ වාදයක් මෙන් ම අසත්‍යය කළ හැකි වාද විද්‍යාත්මක වේ. ඒ සඳහා නිදසුන් වන්නේ,

    I. ඔක්සිකරණවාදය, ගුරුත්වාකර්ෂණ වාදය
    II. ඔක්සිකරණ වාදය, සාමාන්‍ය සාපේක්ෂතාවාදය
    III. ගුරුත්වාකර්ෂණය වාදය, වායුව පිළිබඳ චාලක වාදය
    IV. සාමාන්‍ය සාපේක්ෂතා වාදය, ඔක්සිකරණවාදය
    V. පෘථිවි කේන්ද්‍රවාදය, ඔක්සිකරණ වාදය

3. කාර්ල් පොපර්ගේ අසත්‍යකරණ තීසීසයට අනුව පහත දැක්වෙන ඒවායින් විද්‍යාත්මක නොවන වාදය ලෙස සැලකෙන්නේ කුමක්ද?

    I. දේව වරම් වාදය
    II. මහා පිපුරුම් වාදය
    III. ඖපපාතක ජනනවාදය
    IV. වහර අවහර වාදය
    V. ඊතර වාදය


Copyright © www.e-thaksalawa.moe.gov.lk

4. නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

   I. සෘජු ප්‍රත්‍යක්ෂයට හසු නොවන සංකල්ප විද්‍යාව හදාරන්නේ නැත.

   II. උද්ගාමී අනුමානය හැම විටම සාමාන්‍යකරණයක් නොවේ.

   III. කාර්ල් පොපර්ට අනුව මාක්ස් වාදය විද්‍යාත්මක නොවේ යැයි පවසන්නේ මනෝරාජික වාදයක් නිසාය.

   IV. විද්‍යාත්මක ඥානය පරම සත්‍යයක් ලෙසින් ගොඩනැගුණු ඥානයයි.

   V. කාර්ල් පොපර්ට අනුව විද්‍යාත්මක ක්‍රමය අනුගමනය කළ යුත්තේ උපන්‍යාස තහවුරු කිරීම සඳහාය.

5. පහත සඳහන් ඒවායින් ව්‍යවහාරික විද්‍යාවක් ලෙස සැලකෙන කාණ්ඩය වනුයේ,

   I. අපරාධ විද්‍යාව, ප්‍රකාශ විද්‍යාව, ශක්ති විද්‍යාව

   II. පුරා විද්‍යාව, හරිත විද්‍යාව, පරිසර විද්‍යාව

   III. පරිසර විද්‍යාව, ක්ලෝනීකරණය, හරජීව විද්‍යාව

   IV. පෙදරේරු විද්‍යාව, කෘතිම බුද්ධිය, නාරිවේදය

   V. වසංගත රෝග විද්‍යාව, කර්මාන්ත රසායනය, පටක රෝපණය

6. "අ" යටතේ සඳහන් විෂයයන් "ආ" යටතේ දැක්වෙන වර්ගයන්ට අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර ඇතුළත් වරණය වන්නේ,

| | අ | | ආ |
|---|---|---|---|
| 1 | ප්‍රකාශ විද්‍යාව | a | සමාජ විද්‍යා |
| 2 | අවකලනය | b | භෞතික විද්‍යා |
| 3 | ජනශ්‍රැති විද්‍යාව | c | ව්‍යවහාරික විද්‍යා |
| 4 | සෘග් වේදය | d | රූපික විද්‍යා |
| 5 | කෘතිම බුද්ධිය | e | න. විද්‍යා |

   I. d,a,e,b,c

   II. b,d,a,e,c

   III. e,b,a,d,c

   IV. b,e,c,a,d

   V. c,e,a,b,d

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම :- පී.එම්.අමරසේන මයා, ශාන්ති මරියා කන්‍යාරාමය, මාතර
පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.අයි.යූ.අරම්පොල මෙය, අ/දිගන්හල්මිල්ලවැව විද්‍යාලය, කහටගස්දිගිලිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

7. ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා ප්‍රභේදයට පදනම් වූ කරුණක් නොවන්නේ,

I. විෂයීය බව හා විෂයික බව

II. රූපික බව

III. උපයෝගී කරගන්නා පරීක්ෂණ ක්‍රම

IV. පැහැදිලි කිරීම හා තේරුම් ගැනීම

V. පුරෝකථන හැකියාව

8. න. ආනුභූතික විද්‍යා සම්බන්ධයෙන් අදාල නොවන ලක්ෂණය වන්නේ,

I. වියුක්ත සංකල්ප පිළිබඳ ව හදාරයි

II. බුද්ධිය ඇසුරින් පමණක් ඥානය ගොඩනැගේ

III. ආනුභූතික විද්‍යාවන්ගේ දියුණුවට මඟ පාදයි

IV. සම්භාවිතාවයෙන් යුතු නිගමනයන්ට එළඹේ

V. නිගාමී පද්ධතීන්ගේ සහාය ලබාගනී

9. අනාවරණය හා නිර්මාණය යන්නට පිළිවෙලින් සුදුසුම පිළිතුර ඇතුළත් වරණය වන්නේ,

I. නළ දරුවන්, ඔක්ෂිජන් වායුව

II. ජලකර බෝම්බය, දුරකතනය

III. ඇමරිකා මහාද්වීපය, නෙප්චූන් ග්‍රහයා

IV. DNA අණුවේ ව්‍යුහය, ග්‍රහ භ්‍රමණය

V. ජලභීතිකාව වෛරසයක් මඟින් බෝවන බව, ජලභීතිකා එන්නත

10. කාර්ල් පොපර්ගේ අර්ථයෙන් විද්‍යාත්මක නොවන ප්‍රකාශනයකි.

I. පෘථිවිය ගෝලාකාරය

II. $100^0$C දී ජලය වාෂ්ප බවට පත්වේ.

III. මෙලොව උපන් මිනිසකු කවදා හෝ මියයයි.

IV. මිනිසා වානරයාගෙන් පරිණාමය විය.

V. භෞතික වස්තූන් පරමාණු වලින් සෑදී ඇත.

අන්තර්ගතය සකස් කිරීම :- පී.එම්.අමරසේන මයා, ශාන්ති මරියා කන්‍යාරාමය, මාතර

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.අයි.යූ.අරම්පොල මෙය, අ/දිගන්හල්මිල්ලවැව විද්‍යාලය, කහටගස්දිගිලිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

11. ද්විත්ව විභේදන රාමුවක් තුළ ගොඩ නැගුණු විෂය ධාරාවන් දෙකකි.

I. ශුද්ධ ගණිතය හා තර්ක ශාස්ත්‍රය

II. ශුද්ධ විද්‍යා හා ආනුභවික විද්‍යා

III. ස්වභාවික විද්‍යා හා සමාජ විද්‍යා

IV. සූක්ෂම විද්‍යා හා සාර්ව විද්‍යා

V. ව්‍යුහ විද්‍යා හා ක්ෂුද්‍ර විද්‍යා

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම :- පී.එම්.අමරසේන මයා, ශාන්ති මරියා කන්‍යාරාමය, මාතර

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.අයි.යූ.අරම්පොල මෙය, අ/දිගන්හල්මිල්ලවැව විද්‍යාලය, කහටගස්දිගිලිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිවැරදි වරණයන්

| ප්‍රශ්න අංකය | වරණය |
|---|---|
| 01 | 3 |
| 02 | 5 |
| 03 | 1 |
| 04 | 2 |
| 05 | 5 |
| 06 | 2 |
| 07 | 2 |
| 08 | 4 |
| 09 | 5 |
| 10 | 3 |
| 11 | 3 |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම :- පී.එම්.අමරසේන මයා, ශාන්ති මරියා කන්‍යාරාමය, මාතර
පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.අයි.යූ.අරම්පොල මෙය, අ/දිගන්හල්මිල්ලවැව විද්‍යාලය, කහටගස්දිගිලිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk